**තඹලගමුව ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**--------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 14 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ---------------- | -------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවූ රු. 10,000ක් වටිනා ලංසු තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂයෙන් අන්තර්ගත කිරීම නිසා ලංසු තැන්පතු ලෙජර් ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන ශේෂය අතර වෙනසක් දක්නට විය. | ගෙවූ ලංසු තැන්පතු අඩුකර ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගෙවූ රු.10,000ක් වටිනා ලංසු තැන්පතු වැරදීමකින් අවසන් ශේෂයේ ඇතුළත් කර ඇත. 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දි නිවැරදි කරනු ලබන බව දන්වා සිටිමි. |

**(ආ) ලැබිය යුතු ගිණුම්**

**----------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ---------------- | -------------------------- |
| සභා බල ප්‍රදේශයේ සතර වැනි කොට්ඨාශයේ පැවැති මස්කඩ කාමරයේ හිඟ බදු රු.153,299ක් පසුගිය වර්ෂ 03ක සිට අයකර නොමැතිව අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි. | හිඟ බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අඛණ්ඩව අයකිරීමට ඉදිරි කටයුතු කරමින් පවති. |

**(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 54,428,824 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම සඳහා ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුවේ. | වාහන හැර අනෙකුත් සියලුම වත්කම් සඳහා මිල තක්සේරු කිරීමේ කමිටුවක් ස්ථාපිත කර, එමගින් නැවත ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රමාදයක් සිදු වී තිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2009අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛය | නිවාඩු දින දීමනා ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කළ යුතු බව සඳහන්ව ඇති නමුත් නිලධාරියෙකුට ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් තහවුරු නොකර සමාලෝචිත වර්ෂයේ රු.65,104ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි ලේකම්වරයාගේ ඇඟිලි සලකුණු සටහන් කරන බව ඔබ වෙත දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,820,977ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමරු.745,678ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | 2019 ලැයිස්තුගත කළ ආදායම් | 2019 අයකළ ආදායම් | 2019 දෙසැම්බර් 31 දිනට හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 ලැයිස්තුගත කළ ආදායම් | 2018 අයකළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| කුලී | 11,050 | 5,964 | 5,964 | 270 | 11,050 | 6,477 | 6,344 | 133 |
| බලපත්‍ර ගාස්තු | 2,053 | 940 | 930 | 10 | 1,463 | 913 | 905 | 8 |
| අනෙකුත් | 15,350 | 12,049 | 11,268 | 781 | 4,500 | 3,601 | 3,058 | 543 |
| එකතුව | 28,453 | 18,953 | 18,162 | 1,061 | 17,013 | 10,991 | 10,307 | 684 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල හඳුනාගෙන ඒ සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නිශ්චලදේපල හඳුනාගෙන ඒ සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් පත්කළ කමිටුව වරිපනම් බදු අයකරන ස්ථාන පරීක්ෂා කර ඇත. තවද, 2020 පළමු කාර්තුවේ මේ පිළිබඳව කටයුතු කිරීමේදී අවාසනාවන්ත ලෙස කොවිඩ් 19 බලපෑම් හේතුවෙන් මෙම කාර්යයට බාධා ඇති විය. මේ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදිත් උපදෙස් ලැබී ඇත. එයට අනුව මධ්‍යකලපුව තක්සේරු දෙපාර්තමේන්තුවට අපගේ නිලධාරින් දෙදෙනෙකු යැවීමට කටයුතු කර ඇත. |

### 2.2.3 මස්කඩ බදුකුලී ආදායම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින මස් කඩවලින් හිඟ බදු ආදායම් සමාලෝචිත වර්ෂය දක්වා රු.395,255ක් අතර මෙම හිඟ මුදල් විගණන දිනය වන 2020 ජුනි 02 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.2.4** **මුද්දර ගාස්තු**

-------------

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු අය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කාර්යසාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** අතුරු ව්‍යවස්ථා<br>------------------ | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 09 සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | මේපිළිබඳවසභාවේසාමාජිකයන්ස මගසාකච්ඡාපවත්වාසුදුසුකටයුතු සිදුකර කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇත. |
| (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>------------------------------- | | |
| සභාව විසින් සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ පාලම් පෝට්ට ආරු ප්‍රදේශයේ කැළෑ පෙදෙසක වෙන් නොකර බැහැර කරමින් තිබූ අතර, සභාව විසින් කසල රැස්කිරීමට සුදුසු ඉඩමක් ලබාගෙනඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීමටසුදුසු ඉඩමක් ස්ථාපිත කර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාව විසින් තාවකාලික කසළ "පාලම් පෝට්ට ආරු සිංහ කන්ද" යන ප්‍රදේශය සභාවට ලබාගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙන් අනුමැතිය ලබාදි දැනට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් පවති. එලෙස ලබාගැනිමෙන් පසුව කසල වෙන්කර ප්‍රතිචක්‍රිකරනය, පොහොර භාවිතය සඳහා තීරණය කර ඇත. තවද, 2020 වර්ෂයේ PSDGඅරමුදල් ප්‍රතිපාදනයෙන් මේ සඳහා අරමුදල් සලසා ඇත. |

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

| | | |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ පිළිබඳව නිලධාරීන් විධිමත්ව පුහුණු කර ඉදිරියේදි සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් 2012වර්ෂයේදී කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත් රු.11,800,224ක ණය මේ දක්වා ගෙවා නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වරෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය මුදලෙන් මාස 06ක වාරික මුදල් පමණක් ගෙවා තිබූ අතර අනෙකුත් වාරික ගෙවීම සඳහා සභාවේ ආදායම් ප්‍රමාණවත් නොවන තත්ත්වයක් පැවැතුණු බව ඔබ වෙත දැනුම් දෙමි. |
| (ආ) | 2013 සහ 2014 වර්ෂවලදී සභාව විසින් භාවිතා කරමින් තිබූ රිසිට් පොත් (ලදු පොත්) 09ක් 2015 වර්ෂයේදී අතුරුදහන් වීම නිසා එමඟින් ලැබූ මුදල්, රිසිට් පොත භාර නිලධාරියා විසින් සභාවට භාර දී නොතිබුණි. | මුදල් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරන නිලධාරීන් අධීක්ෂණය කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් සභාවට ගෙවිය යුතු මුදලගණනය කර ඔවුන්ගෙන් අයකරඇති අතර එවකට ලේකම් ලෙස කටයුතු කළ නිලධාරියාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණය සිදු කර විනය නියෝගද නිකුත් කර ඇත. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| | සහකරුවන් 03දෙනෙකු සහ කම්කරුවන් 05ක් සඳහා තනතුරු පුරප්පාඩු පවතින අතර ඒවා පිරවීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් අදාල පත්කිරීමේ බලධාරීන්ට දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවය හැර ගිය සේවකයන්ගෙන් අයකර ගත යුතු රු.16,474ක හිඟ ණය ශේෂය එම සේවකයින්ගෙන් හෝ ඔවුනගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අයකිරීම සඳහා සුදුසු කටයුතු කරනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නිෂ්කාර්යව පවතින වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඇති යතුරු පැදි, රෝද දෙකේ ට්‍රැක්ටරය, රෝද හතරේ ට්‍රැක්ටරය ආදිය අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු නොකර වර්ෂ 03සිට වර්ෂ 12ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ තීරණ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව සුදුසු කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත. |

**3.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ XI පරිශිෂ්ඨයේ 203 වගන්තිය අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් ජනවාරි මුල් කාලපරිච්ඡේදයේ ස්ථාපිත කර එදින සිට මාසයක් ඇතුළත වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබා ගත යුතුවන අතර 206 වගන්තිය ප්‍රකාරව එහි පිටපත් විගණකාධිපතිවරයාට යවා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත කාලයේ සකස් කර එහි පිටපත් විගණකාධිපතිවරයාට යැවිය යුතුවේ. | 2019 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව දැනට සම්පූර්ණ කර ඇති අතර එහි පිටපත් වහාම ඔබ වෙත යැවීමට කටයුතු කර ඇත. |

**3.5 අරපිරිමැසුම්දායක නොවන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2012 ජනවාරි සිට 2016 අප්‍රේල් දක්වා සේවය කළ සේවකයන් සඳහා සේවක භාරකාර අරමුදලට දායක මුදල් එයට වගකිව යුතු සේවකයන් ගෙවීම පැහැර හැරීම නිසා සභාව රු.52,673ක් දඩ මුදල් ලෙස ගෙවා තිබුණි. | අදාල කාලය තුළ ගෙවිය යුතු සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ අරමුදල් පහසුකම් නොමැති වීමෙන් නියමිත කාලයේ වැටුප් ගෙවීමට නොහැකි වීමෙන් සේවක භාරකාර අරමුදලට දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණු බව ඔබ වෙත දන්වා සිටිමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128දරන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. |

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) **පොදු වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (1) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභාව ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ රු.10,743,042 ක කොන්ත්‍රාත් වටිනාකමින් ඉදි කරමින් පවතින වෙළඳපොල ගොඩනැගිල්ල 2018 ජනවාරි 22 දින අවසන් කර සභාවට භාරදිය යුතු වුවත් ඉදිකිරීම් කටයුතු විගණන දිනය වන 2019 මැයි 15 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර රු.537,152 ක් වටිනා ප්‍රමාද ගාස්තු ද අයකර | ඉදිකිරීම් කටයුතු නිම කර ගැනීමට,ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට හා අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් මේ දක්වා නිදහස් නොකළ බැවින් ඇප මුදලින් ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට අප විසින් දැනුම් දෙනු ලබන බව දන්වා සිටිමි.<br>අදාළ වෙළඳපොල ගොඩනැගිල්ලේ ඔබ විසින් අනාවරණය කර තිබූ කාර්යයන් සඳහා වූ ගෙවීම් වවුචරයේ තාක්ෂණික නිලධාරී විසින් සිදුකළ නිර්දේශ පදනම්ව සභාපතිවරයා විසින් අදාළ කොන්ත්‍රාත්කරු ඉල්ලීම් සිදුකළ |

| | | |
|---|---|---|
| නොතිබුණි. තවද 81.5 $m^3$ සීලින් (ceiling), පොළොවට ඇල්ලූ ටයිල්, ස්කර්ටින් (skirting) ආදිය නිසි අයුරින් අල්ලා නොතිබියදී සහ බිත්ති පින්තාරු කිරීම් පුපුරා තිබියදී මේවා පිළිබඳ අවධානය යොමු නොකර ගෙවීම් සිදු කිරීමට තාක්ෂණික නිලධාරීගේ වාර්තා නොලබා සභාවේ සභාපතිවරයා විසින් නිර්දේශ කර තිබුණි. | | බැවින් පළාත් පාලන කොමසාරිස්වරයාට නිර්දේශ ලිපි ලබා දී තිබුණු බව දන්වා සිටිමි. |

**4.** **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර තිබූ අතර ඔහු විසින් මාසිකව අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කළ යුතු බවට සඳහන් වූවත්, විගණන දිනය වන 2020 ජූනි 02 දින වන විටත් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණක පත්කර තිබූ නමුත්, අරමුණ සාක්ෂාත් කරගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයා විසින් අභ්‍යන්තර විගණන කටයුතු සාර්ථකව ඉටුකලයුතු වේ. | පසුගිය 2020.05.18 දින මුලින්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විණි. එහිදි, අභ්‍යන්තර විගණනය පිළිබඳ උපදෙස් ලැබී තිබුණි. එයට අනුව ඉදිරියේදි විධිමත්ව අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරනු ලබන බව දන්වා සිටිමි. |

4.2 **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව සඳහන් වූවත්, සභාව විසින් කිසිදු රැස්වීමක් සමාලෝචිත වර්ෂයේ පවත්වා නොතිබුණි. | කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැතිවිය යුතුවේ. | 2020 මැයි 18 දින මාසයේ පළමු කාර්තුව සඳහා වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා තිබුණි. අඛණ්ඩව සෑම කාර්තුවකම රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත. |